ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 ඔක්තෝබර් මස 15 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 ඔක්තෝබර්

මෙතෙක් ක්‍රියාත්මකකරන ලද ප්‍රතිපත්තිවල සාර්ථකත්වය පෙන්නුම් කරමින්, විචක්ෂණශීලී ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ සැපයුම් අංශයේ වැඩිදියුණුවීම්හි ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය පසුගිය මාස 56 තුළදී තනි අංකයක පැවතුණි. 2013 සැප්තැම්බර් මාසයේ දී, මතුපිට උද්ධමනය සියයට 6.2 ක් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) දක්වා සුළුවශයෙන් අඩු වූ අතර, මූලික උද්ධමනය එහි අවම අගය වූ සියයට 3.0 (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) දක්වා අඩු විය. අන්තර්ජාතික වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඉහළයාම සීමාවීම, දේශීය සැපයුම් අංශයේ පීඩනයන් පහළයාම මෙන්ම ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනාත්මක පීඩන මනාලෙස පාලනයවීම හමුවේ උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම අඛණ්ඩවම හිතකර වනු ඇත.

වර්තමාන මුදල් තත්ත්වයන් 2013 දෙවන කාර්තුවේ දී ඉහළ වර්ධනයකට මඟපාදන බව පෙන්නුම් කරමින්, 2013 අගෝස්තු මාසයේදී පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය වසර සඳහා පුරෝකථනය කරන ලද මට්ටමට අනුකූලව පැවතුණි. මුදල් ප්‍රවාහ තත්ත්වයන් වැඩිදියුණුවීම හේතුකොටගෙන 2013 අගෝස්තු මාසයේ දී රාජ්‍ය සංස්ථා බැංකු අංශයෙන් ලබාගත් ණය සැලකියයුතු ලෙස පහළ බැසීම, තවදුරටත් සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමඟින් ඉල්ලුම් අංශයේ පීඩන මැඩපැවැත්වීම මෙන්ම පෞද්ගලික අංශය වෙත ආයෝජන සඳහා සම්පත් මුදාහැරීමට හැකියාව ලැබෙනු ඇත. තවද, ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික සහ ණය පොලී අනුපාතික ඇතුළු කෙටිකාලීන පොලී අනුපාතික, 2012 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් ලෙස අඩු වූ අතර, දිගුකාලීන ණය පොලී අනුපාතික තවදුරටත් පහළ යාම සඳහා අවකාශ පවතී.

ඉල්ලුම් පීඩන නොමැතිවීම හමුවේ, ආර්ථික වර්ධනය තීව්‍ර කිරීමට අවශ්‍ය උත්තේජකයන් ලබාදීම අරමුණුකොටගෙන වසර තුළදී, මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම සිදු කරනු ඇත. මෙම තත්ත්වය තුළ, 2012 දෙසැම්බර් මාසයේ දී සහ 2013 මැයි මාසයේ දී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම, ආර්ථික හවුල්කරුවන්ගේ ණය ගැනීමේ පිරිවැය ක්‍රමිකව අඩුකරනු ඇති අතර එමඟින් පෞද්ගලික අංශයේ

ආයෝජන දිරිමත් වනු ඇත.  මෙම ප්‍රතිපත්ති, සාර්ව ආර්ථික පරිසරය සවිබල ගන්වමින් 2013 වසරේ දී ආර්ථිකයට දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධන අනුපාතය සියයට 7 මට්ටම පහසුවෙන්ම ඉක්මවීමට අවශ්‍ය හැකියාව ලබා දෙනු ඇත.

මේ අතර, දියුණු ආර්ථිකයන්හි සහ නැගීඑන වෙළෙඳපොළ ආර්ථිකයන්හි මෑතකාලීන වර්ධන පුරෝකථනයන් ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම පිළිබඳව අවිනිශ්චිතතාවයන් මතු කරනු ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ෆෙඩරල් සංචිත බැංකුව විසින් ප්‍රමාණාත්මක ලිහිල්කරණයන් හීනකිරීම ප්‍රකාශයට පත්කිරීම ප්‍රමාදකිරීම හරහා පැණනැගුණු අවිනිශ්චිතතාවයන් ඉහළ යාම සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇතැම් රාජ්‍ය ආයතන වසා දැමීම මෙන්ම ණය සීමාව ඉහළ දැමීමට ඇති නොහැකියාව හේතුකොටගෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ මතුව පවතින වර්තමාන දේශපාලනික නොසන්සුන්තාවයද වෙළෙඳපොළ විචලතාවය තවදුරටත් ඉහළ දමනු ඇත.  එසේ වුවත්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල්, අපනයන ඉපැයුම් ඉහළයාම සහ ආනයන මත වූ වියදම අඩුවීම හේතුකොටගෙන වෙළෙඳ ගිණුමේ හිඟය 2013 අගෝස්තු මාසයේදී සියයට 24.2 කින් අඩුවීම, වර්තන ගිණුම සහ ගෙවුම් තුලනය මත වන පීඩනය තවදුරටත්  ලිහිල් කළඅතර එමගින් දළ නිල සංචිතය ආනයනික මාස 4.5 කට සමාන වෙමින් එ.ජ. ඩොලර් බිලියන 7 ක් බවට පත්විය.

මෙවැනි පසුබිමක් තුළ, උද්ධමන හා උද්ධමනය පිළිබඳ ඉදිරිදැක්ම හිතකර මට්ටමක පවතින බැවින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිය පූර්ණ විභවතාවයට ළඟාවීමට සහ 2014 වසරේදී ආර්ථිකය ඉහළ වර්ධන මාවතකට ගෙනයාමට අවශ්‍ය සවිබල ලබාදීම සඳහා මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමේ අවකාශ පවතින බව මහ බැංකුවේ මතයයි. ඒ අනුව, 2013 ඔක්තෝබර් මස 14  වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී, ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය, පිළිවෙළින්, පදනම් අංක 50 කින් පහළ දැමීමට තීරණය කළ අතර එබැවින් එතැන් සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 6.50 ලෙසද  සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 ලෙසද පවතිනු ඇත.

ඉදිරියට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.